# රජයේ නිවේදන

## 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත

### 3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මඟින් මෙහි උපලේඛනයෙහි I, II හා III වන තීරුවල නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති සෑම භාණ්ඩයක් මතම සහ එම භාණ්ඩ වලට අනුරූප 2017 නොවැම්බර් මස 09 දිනැති අංක 2044/32 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයේ I වන උපලේඛනයෙහි සහ 2018 නොවැම්බර් මස 12 දිනැති අංක 2097/3 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයේ උපලේඛනයෙහි සඳහන් අනුරූප භාණ්ඩ මත ඊට අනුරූපව මෙහි උපලේඛනයෙහි IV වැනි තීරුවෙහි දක්වා ඇති නිෂ්පාදන බදු අනුප්‍රමාණයන් 2018 දෙසැම්බර් මස ..04.. දින සිට ගෙවිය යුතු බව, ප්‍රකාශයට පත් කරමි.

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ පනවන ලද 2018 නොවැම්බර් මස 12 දිනැති අංක 2097/3 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත නියෝගය 2018 දෙසැම්බර් මස .....04..... දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍ය.

2018 ..12..03.. වැනි දින,
කොළඹ 01,
මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ දී ය.

## උපලේඛනය

| සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය I | සංයෝජිත වර්ගීකරණ සංකේතය II | විස්තරය III | නිෂ්පාදන බද්ද IV |
|---|---|---|---|
| 22.02 | | සීනි හෝ අනෙකුත් පැණිරස කාරක ද්‍රව්‍යයන් එකතු කරනු ලැබුවා වූ හෝ රස කළා වූ, ඛනිජ ජලය හා වායුව කවන ලද (එරේටඩ්) ජලය ඇතුළු ජල වර්ග හා ශීර්ෂ 20.09 හි සඳහන් පළතුරු හෝ එළවළු යුෂ අඩංගු නොවූ අනෙකුත් අමද්‍යපාන වර්ග | |

Scanned with CamScanner

| | | | |
|---|---|---|---|
| | 2202.10 | සීනි හෝ වෙනත් පැණිරස කාරක ද්‍රව්‍යයන් එකතුකරනු ලැබුවා වූ හෝ රසකළා වූ, ඛනිජ ජලය හා වායුව කවනු ලැබුවා වූ (එරේටඩ) ජලය ඇතුළු ජල වර්ග | ලීටරයට රු. 12/- හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100 කට ග්‍රෑම් 6 ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30/- යන දෙකෙන් වැඩි අගය |
| | 2202.99 | අනෙකුත් | |
| | 2202.99.30 | "ශක්ති ජනක පාන" ලෙස අලෙවි වන පාන වර්ග | ලීටරයට රු. 12/- හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100 කට ග්‍රෑම් 6 ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30/- යන දෙකෙන් වැඩි අගය |
| | | පළතුරු හෝ එළවළු යුෂ පාදක කර ගත් පානයන්: | |
| | 2202.99.51 | මිලි ලීටර 100 ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6 ට වඩා වැඩි පානයන් | ලීටරයට රු. 12/- හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100 කට ග්‍රෑම් 9 ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30/- යන දෙකෙන් වැඩි අගය |
| | | අනෙකුත්: | |
| | 2202.99.91 | මිලි ලීටර 100 ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6 ට වඩා වැඩි පානයන් | ලීටරයට රු. 12/- හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100 කට ග්‍රෑම් 9 ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30/- යන දෙකෙන් වැඩි අගය |

Scanned with CamScanner